

ජාතික පොලිස් කොමිෂන් සභාව
தேசிய பொலிஸ் ஆணைக்குழு
National Police Commission

2024

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயல்திறன் அறிக்கை
Annual Performance Report

2024 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව

ජාතික පොලිස් කොමිෂන් සභාව

වැය ශීර්ෂ අංකය 08

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ 02
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 11
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 30
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක 43
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 45
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 47
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 48

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

2002 වර්ෂයේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙරට තුළ පිහිටවනු ලැබූ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනත් කවර රාජ්‍ය ආයතනයකටත් වඩා බලතල හා කාර්යභාරය වරින්වර වෙනස් වෙමින් ක්‍රියාත්මක වූ ආයතනයකි. 2002 වසරේදී 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පොලිස්පතිවරයා හැර සියලුම පොලිස් නිලධරයන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීමේ බලතල සහ පොලිස් නිලධරයෙකුට හෝ පොලිස් සේවයට හෝ එරෙහිව මහජනයාගෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීමේ බලතල කොමිෂන් සභාව වෙත හිමිවිය. එසේ වුවද 2010 වසරේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 18 වන සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල පොලිස් නිලධරයන්ට එරෙහිව ඉදිරිපත් වන මහජන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පමණක් සීමාවිය. නැවතත් 2015 වසරේ දී 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පොලිස් නිලධරයන්ගේ පත් කිරීම්, මාරු කිරීම් හා විනය බලතල මෙන්ම මහජන පැමිණිලි විමර්ශන බලතල ද කොමිෂන් සභාව වෙත පැවරිණි. 2020 වසරේ දී 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සශෝධනය මගින් කොමිෂන් සභාවේ බලතල නැවතත් මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ බලතලවලට පමණක් සීමාවිය.

කෙසේ වෙතත් 2022 ඔක්තෝම්බර් මස 31 වන දින සම්මත කරන ලද 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් නැවතත් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පූර්ණ බලතල හිමිවිය. එහෙත් 2022.10.31 දින සිට 2023.05.15 දින දක්වා නව කොමිෂන් සභාව පත්කර කටයුතු ආරම්භ කරන තෙක් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පත්කළ කොමිෂන් සභාව නව බලතල යටතේ කටයුතු කරන ලදී.

2023 මැයි මස 16 වන දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ගරු ජනාධිපතිතුමා විසින් විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඊ.ඩබ්.එම්. ලලිත් ඒකනායක මහතාගේ සභාපතිත්වයෙන් යුතුව නව කොමිෂන් සභාවක් පත් කරන ලදී. අධිකරණ ක්ෂේත්‍රය, නීති ක්ෂේත්‍රය, රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය, සමාජ විද්‍යා ක්ෂේත්‍රය සහ කළමනාකරණ ක්ෂේත්‍ර වැනි ක්ෂේත්‍ර ගණනාවක විශිෂ්ට එමෙන්ම අත්දැකීම් බහුල සාමාජිකයින්ගෙන් වර්තමාන ජාතික පොලිස් කොමිෂන් සභාව සමන්විත වේ.

2023 වර්ෂයේ නව කොමිෂන් සභාව පත්වීමත් සමගම කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන නෛතික පසුබිම සැකසීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ අනුව,

(i) අංක 2341/51 සහ 2023.07.20 දිනැති **"ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල පැවරීම"** නම් අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරමින් 85,000 කට ආසන්න පොලිස්

සේවාවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන් (පොලිස් ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරී කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර) පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, විනය පාලනය කිරීමේ හා සේවයෙන් පහකිරීමේ බලය පොලිස්පතිවරයා සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් වෙත අභිනියෝජනය කරන ලදී.

(ii) එසේ අභිනියෝජනය කරන ලද බලතල සම්බන්ධයෙන් කරනු ලැබූ යම් නියෝගයක් හේතුකොට ගෙන අතෘප්තියට පත්වන යම් පොලිස් නිලධරයෙකුට එවැනි නියෝගයකට එරෙහිව ලිඛිත අභියාචනයක් පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත්කල හැකිවන පරිදි අංක 2345/45 සහ 2023.08.16 දිනැති **"අභියාචනා කාර්ය පටිපාටික රීති"** නම් අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත්කරනු ලැබීය.

(iii)අංක 2345/46 සහ 2023.08.16 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් "**මහජන පැමිණිලි භාරගැනීම සහ විමර්ශනය කිරීම සඳහා වන කාර්ය පටිපාටික රීති"** ඇතුලත් පොලිස් නිලධාරීන් හෝ පොලිස් සේවයට එරෙහි මහජන පැමිණිලි විමර්ශන රීති සකස් කර ප්‍රකාශයට පත් කර ඇත.

එමෙන්ම මේවන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඌ (3) (අ) වන ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සම්පාදනය කර පොලිස්පතිවරයාගේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇති අතර ඔහුගේ නිරීක්ෂණ ලද වහාම ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු සිදු කිරීමට නියමිත වේ. ඒ අනුව මෙතෙක් ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වෙනුවට පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති බලාත්මක වනු ඇත.

2024 සමාලෝචිත වර්ෂය අවසන් වන විට නව කොමිෂන් සභාව පත්වී මාස 18 ක් පමණ කාලයක් ගත වී ඇති අතර එම කාලය තුළ පොලිස් සේවාව ස්වාධීන, කාර්යක්ෂම සහ අපක්ෂපාතී සේවාවක් බවට පත් කිරීම සම්බන්ධයෙන් වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් ගෙන ඇත.

පොලිස් සේවාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය තීරණවලට අමතරව කොමිෂන් සභාවේ කාර්යභාරය සහ වගකීම් පිළිබඳව සහ මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ වගකීම සම්බන්ධයෙන් දිවයින පුරා රාජකාරියේ නියුතු පොලිස් නිලධරයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මේවනවිට ආරම්භ කර ඇති අතර එහි ආරම්භක වැඩසටහ 2024 දෙසැම්බර් 24 වන දින පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සෘජු සහභාගීත්වය සහිතව මාතලේ සහ මහනුවර පොලිස් කොට්ඨාස කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක කරන ලදී. එමෙන් ම කොමිෂන් සභාවේ කාර්යභාරය හා වගකීම් පිළිබඳව පොලිස් නිලධරයන් මෙන්ම මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇති අතර මෙම කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍යමය සහය ලබාගැනීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ සාකච්ඡා සිදුකරමින් පවතී.

නව කොමිෂන් සභාව 2023 වර්ෂයේ කටයුතු ආරම්භ කරනවිට නව බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය සතුව නොමැතිවීම එම බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැවති විශාල අභියෝගයක් මෙන්ම බාධාවක් විය. ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කරමින් විවිධ උත්සාහයන් දැරුවද මෙතෙක් අපේක්ෂිත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට නොහැකි වී ඇති අතර තවදුරටත් ඒ පිළිබඳව උත්සාහයන් දරමින් සිටී. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය අතරින් ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/III ශ්‍රේණිවල අනුමත තනතුරු 08ක් ඇතුළුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 26ක කාර්යමණ්ඩල හිඟයක් ද සහිතව කොමිෂන් සභාවට කටයුතු කිරීමට සිදුවී ඇති බව සඳහන් කළ යුතුය.

කෙසේ වුවද, මෙවැනි සීමිත කාර්ය මණ්ඩලයක් සහිතව ක්‍රියාත්මක වන ජාතික පොලිස් කොමිෂන් සභාව නව බලතල පැවරීමත් සමග රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යොමුකරන ලද ලිපිගොනු 10,696 ක කටයුතු මෙන්ම 2023 සහ 2024 වර්ෂ වල දෛනිකව ලැබෙන ඉල්ලීම් හා අභියාචනා ඉටුකිරීම සඳහා කඩිනමින් කටයුතු කර ඇත. එවැනි අභියාචනා 18,586 ක් 2024 වර්ෂය තුළ පමණක් ලැබී ඇති අතර එවැනි අභියාචනා විමර්ශන කටයුතු ද අප්‍රමාදව ඉටුකරමින් පවතී.

මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඇතුළු කොමිෂන් සභා සාමාජික මහත්ම මහත්මීන් නිරන්තරයෙන් උපදෙස් ලබාදෙමින් අනගි මහ පෙන්වීමක් සිදුකරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද ලිපිගොණු සම්බන්ධව කටයුතු කිරීමේ දී සීමිත කාර්ය මණ්ඩලයක් මගින් කාර්යක්ෂම ලෙස රාජකාරී කටයුතු කළමනාකරණය කිරීමටත්, නව කාර්යමණ්ඩලය බඳවා ගැනීමට/ අනුයුක්ත කර ගැනීමටත් විශාල වෙහෙසක් දැරීමට සිදුවිය. එසේම කොමිෂන් සභාවේ නව බලතල ක්‍රියාත්මක කිරීම සඳහා භෞතික සම්පත් සම්පාදනය කර ගැනීමට ද මෙම කාලය තුළ හැකිවිය. මේ යටතේ කොමිෂන් සභාව සඳහා අමතර ඉඩපහසුකම් BMICH පරිශ්‍රය තුලින්ම ලබා ගැනීමට හැකිවිය. පැරණි වාර්තා පොත්පත් ගබඩා කර ඇති ලේඛනාගාරය තොරතුරු දැනගැනීමේ පනත යටතේ ලිපිගොනු සංරක්ෂණය කිරීම සඳහා පූර්ණ ලෙස ප්‍රතිසංවිධානය කර යාවත්කාලීන කිරීම 2024 වර්ෂය තුළම අවසන් කර ඇත. මීට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් එකවර ලද ලිපිගොනු සහ පොලිස් නිලධාරීන්ගෙන් දෛනිකව ලැබෙන සියලු ලිපිගොනු එක් පරිගණක දත්ත පද්ධතියකට ඇතුලත් කිරීම සිදු කර ඇති අතර එය මේ කාලය තුළ කොමිෂන් සභාව ලබාගත් විශාල ජයග්‍රහණයකි.

පොලිස් කොමිෂන් සභාවට සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් පත්කරනු ලැබ ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් වන අතර වර්තමාන කොමිෂන් සභා සංයුතිය අධිකරණ සේවාව, රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය, නීති ක්ෂේත්‍රය හා පොලිස් සේවාව වැනි ක්ෂේත්‍ර ගණනාවක අත්දැකීම් බහුල කීර්තිමත් පුද්ගලයින්ගෙන් සමන්විත වේ. කොමිෂන් සභාව, නීතියේ

සාරයත් එහි භාවිතාවත් තුළින් ඉදිරි වසර කිහිපය තුළ දිවයිනේ පොලිස් සේවාවටත්, මහජනතාවටත් වඩාත් ඵලදායී කාර්යභාරයක් ඉටුකිරීමට අවශ්‍ය පූර්ව පියවර තබමින් ජාතික පොලිස් කොමිෂන් සභාව පිළිබඳ මහජන විශ්වාසය ක්‍රමයෙන් ගොඩනැංවීමට කටයුතු කරමින් සිටී.

2024 සැප්තැම්බර් 21 වන දිනට දින නියම කළ ජනාධිපතිවරණය අවස්ථාව වන විට හිටපු පොලිස්පතිවරයා හට ධූරය දැරීම වලකාලමින් ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් නිකුත් කර තිබූ පසුබිම තුළ සහ වැඩබලන පොලිස්පතිවරයෙකු හෝ පත් නොකර සිටි පසුබිම තුළ සහ එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) තනතුරේ සේවය කළ නිලධරයා විනය කටයුතු හේතුවෙන් අනිවාර්ය නිවාඩු ගන්වා සිටි පසුබිමක ජාතික පොලිස් කොමිෂන් සභාව ස්වකීය බලතල උපයෝගී කරගනිමින් තාවකාලික පදනමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලරයෙකු පත්කිරීම මගින් ජනාධිපතිවරණය අභියස රට තුළ යම් අස්ථාවර ස්වභාවයක් ඇති වීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගනු ලැබීය.

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස් සේවාවටත්, මහජනතාවටත් වඩාත් ඵලදායී කාර්යභාරයක් ඉටුකිරීමට අවශ්‍ය මූලික පියවර මෙම කෙටිකාලය තුළ ගෙන ඇත. ශ්‍රී ලංකාව රාජ්‍යයක් ලෙස ආර්ථික, දේශපාලන සහ සමාජීය වශයෙන් ඉතා දුෂ්කර කාල පරිච්ඡේදයක් පසුකරමින් සිටින කාලවකවානුවක වත්මන් ජාතික පොලිස් කොමිෂන් සභාව, ශක්තිමත් සහ ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස පිහිටුවීමේ ව්‍යවස්ථාදායක අභිප්‍රාය ඉටුකරනු වස් නිර්භයව සහ අපක්ෂපාතීව ස්වකීය ව්‍යවස්ථාදායක කාර්යභාරය වේගවත්ව ක්‍රියාත්මක කිරීමට කැපවී සිටී.

2024 සමාලෝචිත වර්ෂයේ එනම්, 2024.01.01 සිට 2024.12.31 දක්වා ජාතික පොලිස් කොමිෂන් සභාවේ එක් එක් අංශ හා ඒකක විසින් ඉටුකර ඇති සමස්ත කාර්ය සාධනය සහ අත්පත් කරගෙන ඇති ප්‍රගතිය සහ මුහුණ දුන් අභියෝගයන් ද මෙම වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"විශ්වසනීයවූත්, ස්වාධීනවූත්, වෘත්තීමය පොලිස් සේවයක් තුළින් සුරක්ෂිත, නිරුපද්‍රිත සහ සාමකාමී සමාජයක් නිර්මාණය කිරීමට සහාය වීම"

මෙහෙවර

"මානව අයිතිවාසිකම්වලට ගරු කරමින්, නීතිය සහ සාමය පවත්වාගනිමින්, මහජන වගවීම සහතික කරමින්, නීතියේ ආධිපත්‍ය තහවුරු කරමින්, කාර්යක්ෂම, මහජන අභිලාෂයන්ට ප්‍රතිචාර දක්වන සේවාවක් බවට ශ්‍රී ලංකා පොලිස් සේවය පරිණාමණය කිරීම."

අරමුණු

පොලිස් සේවාවේ මානව සම්පත් ඵලදායී ලෙසත්, කාර්යක්ෂම ලෙසත් කළමනාකරණය කිරීම තුළින් ගුණාත්මක ප්‍රතිපත්ති සහ යහපත් පරිචයන් ක්‍රියාවට නංවමින්, වෘත්තීමය වශයෙන් උසස් සහ තෘප්තිමත් පොලිස් සේවයක් ඇති කිරීම.

කිසිදු නොමනා අගතියකින් හෝ අනුග්‍රහයකින් මෙන්ම වෙනස්කොට සැලකීමකින් තොරව මානව අභිමානය සහ නීතියේ ආධිපත්‍ය සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව පොලිසියට එරෙහිව ඇති මහජන පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීම මගින් මහජන අභිලාෂයන්ට ප්‍රතිචාර දැක්වීම සහ වගවීම.

මානව සුරක්ෂිතතාව ඇතිකිරීම සහ අපරාධ වැලැක්වීම අවධාරණය කරමින්, වෙනත් පාර්ශව කරුවන් සමග සමීප සහයෝගීතාවයකින් යුක්තව විවිධ පියවර සැලසුම් කරමින් සහ ක්‍රියාවට නංවමින් පොලිස් සේවයේ කාර්යක්ෂමතාව සහ ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම සඳහා සාකල්‍යමය ප්‍රවේශයක් අනුගමනය කිරීම.

වටිනාකම්

ස්වාධීනත්වය

අවංකභාවය

වගවීම

අපක්ෂපාතීත්වය

සහයෝගීතාව

අඛණ්ඩ ඉගෙනුම

නිර්මාණශීලීත්වය

1.3 ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන සංශෝධනයේ 155 උ(1)(අ) වගන්තිය ප්‍රකාරව පොලිස් කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල සහ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

(1) පොලිස්පතිවරයා හැර, පොලිස් නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ බලය ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැවරිය යුත්තේය.

(2) මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් පොලිස් නිලධරයෙකුට හෝ පොලිස් සේවයට හෝ විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීමේ සහ ඒවා විමර්ශනය කිරීමේ කාර්ය පටිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර, පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක විධිවිධාන සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේය .

(3) පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයා විමසා පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් වූ පහත සඳහන් සියලු කාරණා සඳහා කටයුතු සැලසීමද, ඒ කාරණා නිශ්චය කිරීමද කරනු ලැබිය යුත්තේය.

(අ) තත්කාර්ය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ප්‍රතිපත්තියකට යටත්ව පොලිස් නිලධාරීන් බඳවා ගැනීම, උසස් කිරීම සහ ස්ථාන මාරු කිරීම පිළිබඳ පටිපාටි සකස් කිරීම;

(ආ) පුහුණුව සහ පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම;

(ඇ) ජාතික හා පළාත් අංශයේ භාවිතය සඳහා අවශ්‍ය අවිආයුධ, වෙඩි ද්‍රව්‍ය සහ වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය තීරණය කිරීම; සහ

(ඈ) වර්යා සංග්‍රහය සහ විනය පිළිබඳ පටිපාටි සකස් කිරීම

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන උප ලේඛනයේ I වන පරිශිෂ්ටයේ 1 වන ලැයිස්තුවේ සඳහන් පරිදි කොමිෂන් සභාව වෙත පවරා ඇති සියලු බලතල ක්‍රියාත්මක කිරීම හා සියලු කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතුය.

1.4 කොමිෂන් සභාවේ සංයුතිය

සභාපති

ඊ්.ඩබ්ලිව්.එම්. ලලිත් ඒකනායක මහතා (විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු)


සාමාජිකයින්

1. ඩී.කේ. රේණුකා ඒකනායක මහත්මිය (විශ්‍රාමලත් අමාත්‍යාංශ ලේකම්)
2. කනපතිපිල්ලේ කරුණාහරන් මහතා (විශ්‍රාමලත් දිස්ත්‍රික් ලේකම්)
3. ජේ.ඒ. ජයසිංහ මහතා (විශ්‍රාමලත් නියෝජ්‍ය පොලිස්පති)
4. දිල්ෂාන් කපිල ජයසූරිය මහතා (ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ)
5. ඒ. ඒ. එම්. ඉල්ලියාස් මහතා (ජනාධිපති නීතීඥ)

ලේකම්

තමරා ඩී. පෙරේරා මහත්මිය (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණිය - විශ්‍රාමික)

1.5 සංවිධාන සටහන


ජාතික පොලිස් කොමිෂන් සභාව
සංවිධාන ව්‍යුහය
කොමිෂන් සභාව
සභාපති
ලේකම්
මානව සම්පත් කළමනාකරණ අංශය
පරිපාලන, පරිරක්ෂණ හා සංවර්ධන අංශය
ගිණුම් අංශය
අභ්‍යන්තර විගණන එකකය
නීති එකකය
අධ්‍යක්ෂ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ප්‍රධාන ගණකාධිකාර
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ
පළාත අධ්‍යක්ෂ
ප්‍රධාන පරීක්ෂණ නිලධාරි
නීතිඥ/ සහකාර අධ්‍යක්ෂවරු
සහකාර ලේකම්
පරිපාලන නිලධාරි
නීතිඥ/ සහකාර අධ්‍යක්ෂවරු
නීතිඥ/ සහකාර අධ්‍යක්ෂවරු
නීති නිලධාරි
සංවර්ධන නිලධාරි
මාධ්‍ය නිලධාරි
සංවර්ධන නිලධාරි
සංවර්ධන නිලධාරි
සංවර්ධන නිලධාරි
සංවර්ධන නිලධාරි
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක
කාර්යාල සහයක

1.6 කොමිෂන් සභාවේ ප්‍රධාන අංශ සහ ඒකක

1. පාලන, පර්යේෂණ හා සංවර්ධන අංශය

    1.1 පාලන අංශය

    1.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය

    1.3 මාධ්‍ය ඒකකය

2. මහජන පැමිණිලි විමර්ශන අංශය

    2.1. ප්‍රධාන කාර්යාලයේ විමර්ශන අංශය

    2.2 පළාත් කාර්යාල - 10

    බස්නාහිර පළාත් කාර්යාලය I, බස්නාහිර පළාත් කාර්යාලය II, දකුණු පළාත් කාර්යාලය, උතුරු පළාත් කාර්යාලය, උතුරුමැද පළාත් කාර්යාලය, වයඹ පළාත් කාර්යාලය, මධ්‍යම පළාත් කාර්යාලය, නැගෙනහිර පළාත් කාර්යාලය, ඌව පළාත් කාර්යාලය, සබරගමුව පළාත් කාර්යාලය.

3. ගිණුම්/ මූල්‍ය අංශය

4. අභියාචනා අංශය

5. ආයතන හා විනය අංශය

6. අභ්‍යන්තර විගණන ඒකකය

7. නීති ඒකකය

1.7 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන අරමුදල්

පොලිස් කොමිෂන් සභාවට මෙය අදාළ නොවේ. (ජාතික පොලිස් කොමිෂන් සභාව ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වේ.)

1.8 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

මේ වන විට විදේශ ආධාර ලබා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වැනි ආයතන සමඟ සාකච්ඡා පැවැත්වෙන අතර ආධාර ලබා ගැනීම සඳහා උත්සුක වෙමින් සිටී.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

එක් එක් අංශවල ප්‍රගතිය, මුහුණදුන් අභියෝග සහ ඉදිරි ඉලක්ක

2.1 පාලන පර්යේෂණ හා සංවර්ධන අංශය

2.1.1 පාලන අංශය

ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලැබෙන සියලුම ලිපි ලේඛන නියමිත පරිදි අංශ අතර බෙදාහැරීම, කොමිෂන් සභාව සතු මානව සම්පත් පරිපාලනය හා කළමනාකරණය, කොමිෂන් සභාව සඳහා අනුමත නව නිලධරයන් බඳවා ගැනීම, සියළුම කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුවීම් හා මග පෙන්වීම් ලබා දීම, කොමිෂන් සභාවට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ එදිනෙදා පරිපාලන කටයුතු ඉටුකිරීම, අවශ්‍ය භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනය, පරිපාලන අවශ්‍යතාවයන් සඳහා කොමිෂන් පත්‍රිකා සැකසීම හා ඊට අනුගත ක්‍රියා ඉටුකිරීම පාලන අංශය සතු ප්‍රධාන කාර්යයන් හා වගකීම් වන්නේය. මහජන පැමිණිලි විමර්ශන කටයුතු සඳහා පළාත් මට්ටමින් පිහිටුවා ඇති කාර්යාල සම්බන්ධයෙන් වන පරිපාලන කටයුතු ද මෙම අංශයේ කාර්ය භාරයට ඇතුළත් වේ.

කොමිෂන් සභා කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය වැනි දීපව්‍යාප්ත සේවාවන්ගෙන් හා භාෂා පරිවර්තක සේවය, සංවර්ධන නිලධාරී සේවය, කළමනාකරණ සේවා නිලධාරී සේවය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය, රියදුරු සේවය හා කාර්යාල කාර්යය සහායක සේවය වැනි ඒකාබද්ධ රාජ්‍ය සේවාවන් වලින්ද, දෙපාර්මේන්තුගත නීති නිලධාරී, විමර්ශන නිලධාරී, මාධ්‍ය නිලධාරී, පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු යන නිලධාරින්ගෙන් ද සමන්විත වේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පළාත් අධ්‍යක්ෂ තනතුරු සඳහා විශ්‍රාමික රජයේ විධායක සේවයේ නිලධාරින්ගෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදුකර ඇත. තවද, රාජකාරී අවශ්‍යතාව මත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා අංක අමප/24/0420/601/029 හා 2024.03.04 දිනැති අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ නිර්දේශ මත රා.ප.චක්‍රලේඛ 03/2018 විධිවිධාන වලට යටත්ව මේ වනවිට ශ්‍රී.ලං.ප.සේ. විශ්‍රාමික නිලධාරින් 05ක් ද සේවයේ යොදවා ඇත.

2024.01.01 දින සිට **2024.12.31** දින දක්වා ජාතික පොලිස් කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයේ විස්තර පහත පරිදි වේ.

වගුව 01

අනු අංකය	තනතුර	සේවය	අනුමත තනතුරු සංඛ්‍යාව	වැටුප් ක්‍රේතය	සේවයේ නියුතු		
					ස්ථිර	කොන්ත්‍රාත්	පුරප්පාඩු
1	ලේකම්	ශ්‍රී.ල.ප. සේ.වි.ශ්‍රේ.	1	SL-3		1	
2	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී.ල.ප. සේ. I	1	SL-1	1		
3	අධ්‍යක්ෂ	ශ්‍රී.ල.ප. සේ. I	3	SL-1	3		
4	පළාත් අධ්‍යක්ෂ	කොන්ත්‍රාත්	10	60,000.00		10	
5	ප්‍රධාන ගණකාධිකාරි	ශ්‍රී.ල.ග. සේ. I	1	SL-1	1		
6	අභ්‍යන්තර විගණක	ශ්‍රී.ල.ග. සේ. II/III	1	SL-1			1
7	සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ල.ප. සේ. II/III	10	SL-1	2	5	3
8	සහකාර ලේකම්	ශ්‍රී.ල.ප. සේ. III	1	SL-1			1
9	නීති නිලධාරී	දෙපාර්තමේන්තුගත	2	SL-1	1		1
10	ප්‍රධාන විමර්ශන නිලධාරී	කොන්ත්‍රාත්	1	60,000.00			1
එකතුව			**31**		8	16	7
11	පරිපාලන නිලධාරි	ක.සේ.නිල.අධි	1	MN-7	1		
12	භාෂා පරිවර්තක සි/ඉ	භා.ප. සේ	1	MN-6			1
13	භාෂා පරිවර්තක සි/දෙ	භා.ප. සේ	1	MN-6	1		
14	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි	තො.තා.සේ.	1	MN-6	1		
එකතුව			**4**		3	0	1
15	මාධ්‍ය නිලධාරි	දෙපාර්තමේන්තුගත	1	MN-4	1		
16	විමර්ශන නිලධාරි/සං.නිලධාරි	සං.නිල.සේ.	39	MN-4	29		10
17	කළ.සේවා නිලධාරි	ක.සේ.නිල.සේ	32	MN-2	25	3	4
18	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	තො.තා.සේ.	5	MT-1	3		2
19	දත්ත සටහන් ක්‍රියාකරු	දෙපාර්තමේන්තුගත	1	MN-1	1		
20	කමිටු ලේකම්	කොන්ත්‍රාත්	1	50,000.00		1	
එකතුව			**79**		**59**	**4**	**16**
21	රියදුරු	රියදුරු සේවය	6	PL-3	6		
22	කාර්යාල කාර්ය සහයක සේවය	කා.කා.සේ.	13	PL-1	11		2
එකතුව			**19**		17	0	2
මුළු එකතුව			**133**		**87**	**20**	**26**

මූලාශ්‍රය: පාලන අංශයේ කාර්ය මණ්ඩල දත්ත ඇසුරෙනි.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නිලධාරින්ගේ මානව සම්පත් ප්‍රවර්ධනය සහ ධාරිතා සංවර්ධනය උදෙසා 2024 ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා වන කාලය තුල ආයතනයේ සියලු කාර්ය මණ්ඩලය ඇතුලත් වන පරිදි පහත සඳහන් පුහුණු අවස්ථා ලබා දී ඇත.

2024.01.01 දින සිට **2024.12.31** දින දක්වා නිලධාරින් පුහුණු පාඨමාලා සඳහා සහභාගි වීම.

වගුව 02

අනු අංකය	මාතෘකාව	සහභාගිත්වය
1.	ඩිජිටල් මාධ්‍යවේදී ඩිප්ලෝමා පාඨමාලාව 2024.03.15 – 2024.09.15 දින දක්වා (මාස 06කි.) පාඨමාලා ගාස්තු - රු.42,000/-	පී.ඩී.ලියනආරච්චි මයා (මාධ්‍ය නිලධාරි)
2.	රජයේ වැටුප් සැකසීම සම්බන්ධ පුහුණුව 2024.06.03 - 2024.06.05 (දින 03කි.) පාඨමාලා ගාස්තු - රු.18,000/-	ආර්.ඒ.ජේ.කේ. රූපසිංහ මිය (කළ.සේ.නි.)
3.	රාජ්‍ය ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ අවසන් ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ වැඩමුළුව 2024.09.09 - 2024.09.10 දින 02කි. පාඨමාලා ගාස්තු -26,000/-	කේ.බී.සී.එන්.බාලසූරිය මිය (කළ.සේ.නි.) ඒ.ආර්.එස්.සෙව්වන්දි මෙනවිය (කළ.සේ.නිලධාරි)
4.	රාජකාරී ලේඛන සැකසීම සහ භාෂා හැකියා සංවර්ධනය 2024.11.29 වන දින	කළ.සේ. නිලධාරි සහ සංවර්ධන නිලධාරීන් 35 දෙනෙක් සහභාගී වී ඇත.
5.	ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (2024/2025)	සහකාර අධ්‍යක්ෂ (අභියාචනා) ජී.ඒ.එස්. නිලූක්ෂි මිය
6.	රාජ්‍ය සේවා විනය කාර්ය පටිපාටිය 2024.12.02 - 2024.12.04 (දින 03කි.)	කළ.සේ. නිලධාරී සහ සංවර්ධන නිලධාරී 16ක් සහභාගී වී ඇත.
7.	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව දෙසැම්බර් 5,6 (දින 02කි.)	ඩබ්.ඩී.ඩී.කේ. සුමනදේව මයා (කල.සේ.නි) කේ.කේ.එන්.එස්. කංකානම්ගේ මිය (තො.හා සන්.තා. සහකාර) එම.එම්.එස්. මාවැල්ල මෙය (කළ.සේ.නි)
8.	පැතුරුම්පත් භාවිතය දෙසැම්බර් 20 (දින 01කි.)	කේ.එච්.ඩී. පබසරා මෙය (කළ.සේ.නි.) හා එල්.එස්. පුෂ්පකුමාර මහතා (කළ.සේ.නි.)

මූලාශ්‍රය: පාලන අංශයේ කාර්ය මණ්ඩල පුහුණු දත්ත ඇසුරෙනි.

(2024.01.01 – 2024.12.31 දක්වා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ලැබී ඇති ඉල්ලීම් **)**

ලැබී ඇති ඉල්ලීම් ගණන	- 183
තොරතුරු ලබා දී ඇති ඉල්ලීම් ගණන	- 71
ප්‍රතික්ෂේපිත ඉල්ලීම් ගණන	- 12
ක්‍රියාකරමින් පවතින ඉල්ලීම් ගණන	- 100

2.1.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය

ජාතික පොලිස් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් කාර්යාලයන් හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කර පවත්වාගෙන යාම, කොමිෂන් සභාවේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම, කාර්ය මණ්ඩලයට අවශ්‍ය තාක්ෂණික සහය හා උපදෙස් ලබා දීම මෙම ඒකකයේ කාර්යභාරය වේ.

2.1.3 මාධ්‍ය ඒකකය

මෙම අංශය මගින් දිනපතා පලවන මාධ්‍ය වාර්තා පදනම් කර ගනිමින් කොමිෂන් සභාව වෙත සතිපතා වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන අතර, විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මාධ්‍යවේදීන් සහ ආයතන සමග යහපත් සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීමට කටයුතු කරයි. එසේම කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වරින්වර මාධ්‍ය නිවේදන නිකුත් කිරීම ද මෙම ඒකකය මගින් සිදු කරනු ලැබේ.

මීට අමතරව, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් හෙලිදරව් කරන පොලිස් නිලධාරීන්ගේ සහ පොදුවේ පොලිස් සේවාවේ විෂමාචාර, නීතිය පැහැර හැරීම් සහ වෙනත් අනීතික ක්‍රියා සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ අවධානයට යොමුකර ලැබෙන උපදෙස් පරිදි අවශ්‍ය ඉදිරි පියවර ගැනීම ද සිදු කරනු ලබයි.

2.2 මහජන පැමිණිලි විමර්ශන අංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඌ (2) වගන්තිය අනුව මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීමේ හා ඒවා විමර්ශනය කිරීමේ කාර්යය පරිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මඟින් සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේය. කොමිෂන් සභාව විසින් සහන සැලසීමේදී පොලිස්පතිවරයාට කොමිසම විසින් ඒ බව වහාම දැනුම් දිය යුත්තේය. මෙම මහජන පැමිණිලි විමර්ශන කටයුතු ජාතික පොලිස් කොමිෂන් සභාවේ මහජන පැමිණිලි විමර්ශන අංශය විසින් සහ පළාත් නවයෙහි පිහිටුවා තිබෙන පළාත් කාර්යාල 10 මගින් සිදු කරනු ලබයි.

මහජන පැමිණිලි විමර්ශන අංශය මගින් ඉටුකරනු ලබන සේවාවන් : -

- පැමිණිලි භාරගැනීම
- විමර්ශනය කිරීම.
- විමර්ශනයේදී අනාවරණය වන කරුණු අනුව පොලිස් නිලධරයෙකු ගෙන් හෝ පොලිස් සේවයෙන් යම්කිසි රාජකාරි පැහැර හැරීමක් හෝ නීති විරෝධී කටයුත්තක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් කොමිෂන් සභාවේ තීරණය අනුව අවශ්‍ය පියවර ගැනීමට පොලිස්පති හෝ අදාල බලධාරීන් වෙත යොමු කිරීම සහ ඒ අනුව අදාළ පැමිණිලිකරු දැනුවත් කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධයෙන් පොලිසිය විසින් ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳව කොමිෂන් සභාවේ තීරණය අනුව පොලිස් නිලධාරීන් හට උපදෙස් ලබාදීම.
- මහජන පැමිණිලි විමර්ශන අංශයේ නිලධාරීන් පුහුණු කිරීම.
- කොමිෂන් සභාවට අදාළ නොවන පැමිණිලි සඳහා පැමිණිලිකරුවන්ව නිසි ආයතන වෙත යොමු කිරීම.
- 1960 ක්ෂණික ඇමතුම් සේවය මගින් පැය 24 පුරාම පැමිණිලිකරුවන්ට ක්ෂණික සහන ලබාදීම.

(I) 2024.01.01 වන දින සිට 2024.12.31 වන දිනය දක්වා මහජන පැමිණිලි විමර්ශණ අංශයට ලැබී ඇති පැමිණිලි, පැමිණිල්ලේ ස්වභාවය අනුව වර්ගීකරණය.

වගුව 03

පැමිණිල්ලේ ස්වභාවය	ලැබීම් සංඛ්‍යාව	ලැබීම් ප්‍රතිශතය
පොලීසිය විසින් ක්‍රියා නොකිරීම	843	29.44%
බලය අයථා ලෙස පරිහරණය	649	22.67%
පක්ෂග්‍රාහී වීම	476	16.63%
බොරු චෝදනා කිරීම	202	7.06%
මත්ද්‍රව්‍ය වැරදි	95	3.32%
පහර දීම	65	2.27%
අල්ලස් දූෂණ	120	4.19%
නීති විරෝධී ලෙස රඳවා ගැනීම	52	1.82%
වධ හිංසා පැමිණවීම	24	0.84%
කාන්තාවන්ට හා ළමුන්ට හිංසා කිරීම	11	0.38%
පොලිස් අත්අඩංගුවේ සිටිය දී මරණය සිදු වීම	0	0.00%
වෙනත්	326	11.39%
එකතුව	**2863**	-

මූලාශ්‍රය: මහජන පැමිණිලි විමර්ශන අංශයේ දත්ත ඇසුරෙනි.

(II) 2023.01.01 වන දින සිට 2023.12.31 වන දිනය දක්වා සහ 2024.01.01 වන දින සිට 2024.12.31 වන දිනය දක්වා පැමිණිලි විමර්ශනය පිළිබඳ සංසන්දනාත්මක වාර්තාව.

වගුව 04

2023.01.01 වන දින සිට 2023.12.31 වන දිනය දක්වා පැමිණිලි විමර්ශනය			**2024.01.01 වන දින සිට 2024.12.31 වන දිනය දක්වා පැමිණිලි විමර්ශනය**		
ලැබීම් සංඛ්‍යාව	විමර්ශන අවසන් සංඛ්‍යාව	විමර්ශන අවසන් කිරීමේ ප්‍රතිශතය	ලැබීම් සංඛ්‍යාව	විමර්ශන අවසන් සංඛ්‍යාව	විමර්ශන අවසන් කිරීමේ ප්‍රතිශතය
2448	561	22.91%	2863	335	11.70%

මූලාශ්‍රය: මහජන පැමිණිලි විමර්ශන අංශයේ දත්ත ඇසුරෙනි.

(III) පැමිණිලි විමර්ශනයේ ප්‍රගතිය 2024.01.01 වන දින සිට 2024.12.31 වන දිනය දක්වා.

වගුව 05

පළාත	ලැබීම්	විමර්ශන අවසන් කිරීම්		විමර්ශන කිරීමට නියමිත	
		සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
බස්නාහිර I	723	77	10.65%	646	89.34%
බස්නාහිර II	568	193	33.98%	375	66.02%
දකුණ	385	8	2.08%	377	97.92%
වයඹ	252	8	3.17%	244	96.83%
මධ්‍යම	196	8	4.08%	188	95.92%
සබරගමුව	200	10	5.00%	190	95.00%
උතුරුමැද	167	15	8.98%	152	91.02%
නැගෙනහිර	128	9	7.03%	119	92.97%
ඌව	162	1	0.62%	161	99.38%
උතුර	82	6	7.32%	76	92.68%
එකතුව	**2863**	**335**	11.70%	**2528**	88.29%

මූලාශ්‍රය: මහජන පැමිණිලි විමර්ශන අංශයේ දත්ත ඇසුරෙනි.

මහජන පැමිණිලි විමර්ශනයේ දී මුහුණ දෙන ගැටළු

- මහජනයා විසින් පැමිණිලි සිදු කිරීමේ දී යම් යම් අඩුපාඩු සහිතව පැමිණිලි ඉදිරිපත් කිරීම නිසා නැවත තොරතුරු විමසීමේ දී ඔවුන් දක්වන ප්‍රතිචාරය අවම වීම නිසා පැමිණිලි විමර්ශනය ප්‍රමාද වීම.

- ❖ පොලිස් ස්ථාන වලින් සහ වෙනත් පොලිස් නිලධරයන්ගෙන් විමර්ශනයට අවශ්‍ය තොරතුරු ලබා දීම ප්‍රමාද වීම සහ ප්‍රමාණවත් සහ පැහැදිලි තොරතුරු ලබා නොදීම හේතුවෙන් නැවත නැවත තොරතුරු විමසීමට සිදුවීම නිසා විමර්ශන ප්‍රමාද වීම.

1960 ක්ෂණික ඇමතුම් සේවය

මහජනතාවට ජාතික පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කිරීමට පහසුවනු පිණිස WhatsApp පහසුකම් සහිතව 0710361010 දරන ජංගම දුරකථන අංකය සමඟ අංක හතරකින් යුත් දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක වන මහජන ඇමතුම් අංකයක් (Hot Line) ලෙස 1960 ක්ෂණික ඇමතුම් සේවය ක්‍රියාත්මක වේ.

ඒ අනුව දවසේ ඕනෑම වේලාවක මහජනතාවට නාමිකව හෝ නිර්නාමිකව පැමිණිලි ඉදිරිපත් කළ හැකි අතර එම පැමිණිල්ල ස්වයංක්‍රීයව පටිගතවේ. ඒ සම්බන්ධයෙන් විමර්ශන නිලධාරී විසින් අදාල පියවර ගන්නා අතර පැමිණිලිකරුගේ රහස්‍යභාවය සුරක්ෂිත වන ආකාරයට කටයුතු කර ඉදිරි පියවරයන් සඳහා යොමු කරනු ඇත.

1960 ක්ෂණික ඇමතුම් සේවය ක්‍රියාත්මක කරනු ලබන විමර්ශන නිලධාරීන් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග

1. පැමිණිලිකරුට සාවදානව ඇහුම්කන්දී ලද පැමිණිල්ල සටහන් කර ගැනීම
2. ඉදිරිපත් වූ කරුණු මත ක්ෂණිකව ක්‍රියාත්මක විය යුතු කරුණක් නම් අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයා වෙත හෝ රාජ්‍ය නිවේදිත නිලධරයෙකු වෙත වාචිකව පැමිණිල්ල යොමු කිරීම.
3. එසේ නොමැතිනම් පැමිණිල්ලෙහි සාරාංශයක් ගෙන පොලිස් ස්ථානාධිපතිවරයා වෙත විද්‍යුත් තැපෑල මඟින්/ෆැක්ස් මඟින් හෝ වට්ස් ඇප් මඟින් ලිඛිතව දැනුම්දීම එසේ අපහසු වූ අවස්ථාවක දුරකථන පණිවුඩයක් මඟින් දැනුම් දීම (TR)
4. සිද්ධියට අදාලව පැය 24 ක් තුල ස්ථානාධිපතිවරයාගෙන් වාර්තාවක් ලබාගැනීම.
5. එම වාර්තාවේ සඳහන් කරුණු පැමිණිලිකරුට දැනුම් දීම.
6. පැමිණිලිකරු එම කරුණු හා එකඟ නොවේ නම් විස්තරාත්මකව ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දීම.
7. මීට අමතරව සභාපතිතුමාගේ උපදෙස් මත ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් නිලධරයන් විසින් වැඩ කරන සතියේ දිනයන්හි 1960 වෙත කරනු ලබන අභියාචනා පිලිබඳ විමසීම් සම්බන්ධයෙන් අදාල අංශ වලින් විමසිම් කර අභියාචක නිලධරයන් වෙත අභියාචනය ලැබී දින තුනක කාලයක් තුළ ගෙන ඇති පියවර පිලිබඳව දුරකථනයෙන් ඇමතීම් කර දැනුම් දීමට කටයුතු කිරීම.

(IV) 2024.01.01 වන දින සිට 2024.12.31 වන දිනය දක්වා 1960 ක්ෂණික ඇමතුම් දුරකථන සම්බන්ධතාවය මඟින් මහජන පැමිණිලි සහ පොලිස් නිලධාරීන්ගේ ඉල්ලිම් හා වෙනත් ආයතන සම්බන්ධයෙන් විමසීම් සඳහා කටයුතු කිරීමේ ප්‍රගතිය

2024.01.01 වන දින සිට 2024.12.31 දින දක්වා 1960 ක්ෂණික ඇමතුම් සේවයට ලද පැමිණිලි

වගුව 06

(1)	(2) මහජන පැමිණිලි - 1960 ක්ෂණික ඇමතුම් සේවය			(3) පොලිස් නිලධාරීන්ගේ විමසීම්				(4)	(5)	(6)
	(I)	(II)	(III)	(I)	(II)	(III)	(IV)			
මාසය	පොලිස් ස්ථානාධිපති/ පොලිස් අධිකාරී සහ වෙනත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ක්ෂණිකව සහන ලබා දුන් සංඛ්‍යාව	ක්ෂණිකව සහන ලබා දිය නොහැකි ගැටළු සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබා දුන් සංඛ්‍යාව	මුළු සංඛ්‍යාව (2.I)+(2.II)	අභියාචනා අංශය	ආයතන හා විනය අංශය	AAT අංශය	මුළු සංඛ්‍යාව (3.I) + (3.II) + (3.III)	කොමිෂන් සභා විෂය පථයට අදාළව ලැබුණු පැමිණිලි විමසීම් සංඛ්‍යාව (2+3)	මහජනයා විසින් වෙනත් ආයතන සම්බන්ධයෙන් විමසීම් කරන ලද සංඛ්‍යාව	1960 ක්ෂණික ඇමතුම් දුරකථන සේවය වෙත ලැබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව (4+5)
ජනවාරි	68	417	485	1198	23	11	1232	1717	181	1898
පෙබරවාරි	51	419	470	805	25	14	844	1314	176	1490
මාර්තු	65	390	455	656	12	12	680	1135	144	1279
අප්‍රේල්	28	270	298	497	13	8	518	816	334	1150
මැයි	33	259	292	526	9	10	545	837	390	1227
ජූනි	43	270	313	576	0	2	578	891	600	1491
ජූලි	59	317	376	634	5	4	643	1019	599	1618
අගෝස්තු	68	410	478	566	0	20	586	1064	591	1655
සැප්තැම්බර්	49	322	371	357	6	14	377	748	613	1361
ඔක්තෝබර්	67	362	429	465	8	10	483	912	659	1571
නොවැම්බර්	87	555	642	630	2	6	638	1280	484	1764
දෙසැම්බර්	97	726	823	924	14	28	966	1786	357	2143
එකතුව	**715**	**4717**	**5432**	**7834**	**117**	**139**	**8090**	**13522**	**5125**	**18647**

මූලාශ්‍රය: **1960 ක්ෂණික ඇමතුම් ඒකකයේ දත්ත ඇසුරෙනි.**

2.3 අභියාචනා අංශය

අභියාචනා අංශයේ කාර්යයන්

ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්ට අදාළ පහත සඳහන් අභියාචනා ලද පසු ඒවා ලේඛනගත කිරීම, පොලිස්පති වෙතින් වාර්තා කැඳවීම, කොමිෂන් පත්‍රිකා සකස් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම, කොමිෂන් පත්‍රිකා වලට අදාළව කොමිෂන් සභාව විසින් ලබා දෙන තීරණ අදාළ පාර්ශව වෙත දැනුම් දීම.

අභියාචනා වර්ග

i. සේවය හැර ගිය නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධ අභියාචනා
ii. වැඩ තහනම් කරන ලද නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධ අභියාචනා
iii. පත්වීම අවලංගු කරන ලද නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධ අභියාචනා
iv. උසස්වීම් ලබා ගැනීම, උසස්වීම් පෙරදාතම කිරීම සහ වැරදි ලෙස සිදු කරන ලද උසස්වීම් වලට එරෙහි අභියාචනා.
v. විනය නියෝගයට එරෙහි අභියාචනා.
vi. ස්ථාන මාරු ලබා ගැනීම, ස්ථාන මාරු අවලංගු කරවා ගැනීම සම්බන්ධ අභියාචනා.
vii. විශ්‍රාම ගැන්වීම සම්බන්ධ අභියාචනා.
viii. නැවත සේවයේ පිහිටුවීමේ දී ලබා දුන් කොන්දේසි සංශෝධනය කිරීම සම්බන්ධ අභියාචනා.
ix. පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ පත්වීම්, ස්ථාන මාරුවීම් හා විනය ක්‍රියා මාර්ගවලට අදාළ රාජකාරී.
x. කොන්ත්‍රාත් පදනම මත ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්හි නිලධාරීන් නැවත සේවයට බඳවා ගැනීමට අදාළ රාජකාරී.

අභියාචනා අංශයේ කටයුතු පිළිබඳ සංඛ්‍යා ලේඛන :

I. 2024.12.31 වන දිනට අභියාචනා අංශය තුළ ක්‍රියා කරමින් පවතින ලිපි ගොනු සංඛ්‍යාව පිළිබඳ සංඛ්‍යා දත්ත

වගුව 07

I.	2024.01.01 දිනය වන විට ක්‍රියා කිරීමට පවතින ලිපි ගොනු සංඛ්‍යාව	2534
II.	2024.01.01 සිට 2024.12.31 දක්වා ආරම්භ කළ ලිපි ගොනු සංඛ්‍යාව	2798
	එකතුව	5332
III.	2024.01.06 සිට 2024.12.31 දින දක්වා ඉදිරිපත් කර තීරණයක් ලබා ඇති කොමිෂන් පත්‍රිකා සංඛ්‍යාව	825
IV.	2024.12.31 දිනට අභියාචනා අංශය තුළ ක්‍රියාකරමින් පවතින ලිපි ගොනු සංඛ්‍යාව	**4507**

මූලාශ්‍රය: අභියාචනා අංශයේ දත්ත ඇසුරෙනි.

රාජකාරී විෂයට අනුව 2024.12.31 වන දිනට අභියාචනා අංශය තුළ ක්‍රියාකරමින් පවතින ලිපි ගොනු සංඛ්‍යාව හා එහි වර්ගීකරණය :- *වගුව 08*

රාජකාරී විෂය / කාරණය	උසස් කිරීම් (PRO)	විනය නියෝග වලට එරෙහි අභියාචනා (DIS)	සේවය හැර ගොස් නැවත සේවය ඉල්ලීමට අදාළ අභියාචනා (VOP)	වැඩ තහනම් නිලධාරීන් නැවත සේවය ඉල්ලීම (INT)	පත්වීම් අවලංගුවීමට අදාළ අභියාචනා . (TER)	විශ්‍රාම යාමට ඉල්ලීම හා ඊට අදාළ අභියාචනා (RET)	ස්ථාන මාරු අභියාචනා (TRA)	කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයට ඉල්ලීමේ අභියාචනා (CON)	වෙනත් (OTHER)	මූ.පොා.ප /පොලිස් ස්ථානාධිපතිවරුන්ට එරෙහි විනය	මූ.පොා.ප /පොලිස් ස්ථානාධිපති ස්ථාන මාරුවීම් වලට අදාළ අභියාචනා(OIC/T)	මූ.පොා.ප / ස්ථානාධිපති නිර්ණායක(OIC/Inter:)	එකතුව
01. 2024.01.01 දිනට මුළු ලිපි සහ ලිපි ගොනු සංඛ්‍යාව	1059	686	406	29	10	96	173	7	51	3	14	0	**2534**
02. 2024.01.01. සිට 2024.12.31 දක්වා ලද අභියාචනා සංඛ්‍යාව	516	446	453	310	74	94	468	0	122	250	48	17**	2798
03. (01+02) 2024.01.01. සිට 2024.12.31 මුළු සංඛ්‍යාව	1575	1132	859	339	84	190	641	07	173	253	62	17	5332
04. 2024.01.01. සිට 2024.12.31ඉදිරි පත් කළ කොමිෂන් පත්‍රිකා සංඛ්‍යාව	211	108	218	49	48	43	154	07	19	26	12	17	912
05. 2024.01.01. සිට 2024.12.31ඉදිරි පත් කළ කොමිෂන් පත්‍රිකා සඳහා තීරණයක් ලබා අවසන් කල ගොනු සංඛ්‍යාව	204	82	216	38	32	32	149	07	16	24	08	17	825
06. (03-05) 2024.12.31 වන දිනට ක්‍රියා කිරීමට ඉතිරිව ඇති ලිපි ගොනු සංඛ්‍යාව	1371	1050	643	301	52	158	492	-	157	229	54	0	**4507**

මූලාශ්‍රය: අභියාචනා අංශයේ දත්ත ඇසුරෙනි.

****මූ.පොා.ප / ස්ථානාධිපති නිර්ණායක(OIC/Inter:) සම්බන්ධයෙන් ලද පොලිස්පති වාර්තා**

2024.01.01 වන දින සිට 2024.12.31 වන දින දක්වා කොමිෂන් පත්‍රිකා හා ප්‍රතිලාභීන් පිළිබඳ සංඛ්‍යා ලේඛන

වගුව 09

විස්තරය	කොමිෂන් පත්‍රිකා ගණන	ප්‍රතිලාභීන් ගණන
2024.01.01 වන දින සිට 2024.12.31 වන දින දක්වා	825	1258
එකතුව	825	1258

මූලාශ්‍රය: අභියාචනා අංශයේ දත්ත ඇසුරෙනි.

2.4 ආයතන හා විනය අංශය

ශ්‍රී ලංකා පොලිසියේ රාජ්‍ය නිවේදිත නිලධාරීන් වන සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරු දක්වා වන නිලධාරීන්ගේ ආයතන කටයුතු, එනම් බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම් , ස්ථාන මාරු කිරීම්, සේවය ස්ථිර කිරීම්, වැඩ බැලීම/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම්, ද්විතීයික පදනම මත පොලිස් සේවාවට අවශ්‍යව ඇති වෛද්‍යවරුන් බඳවා ගැනීම, විශ්‍රාම ගැන්වීම, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම සම්බන්ධ සියළු කටයුතු ආයතන හා විනය අංශයෙන් සිදු කරනු ලබයි.

එසේම, ආයතන හා විනය අංශය විසින් රාජ්‍ය නිවේදිත නිලධාරී බාණ්ඩයට අයත් වන සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දක්වා තනතුරු දරණ සියළු නිලධාරීන්ගේ අභියාචනා පිළිබඳ කටයුතු ද සිදු කරනු ලබයි.

ආයතන හා විනය අංශයට පැවරී ඇති රාජකාරී කටයුතු

1) විශේෂ කාර්ය බලකාය ද ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ රාජ්‍ය නිවේදිත නිලධාරීන් වන සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරු දක්වා වන නිලධාරීන්ගේ පත් කිරීම, සේවයේ ස්ථිර කිරීම, උසස් කිරීම හා උසස් කිරීම් පෙරදාතම කිරීම, විශ්‍රාම ගැන්වීම හා අවශ්‍යතාවය අනුව කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධව කටයුතු කිරීම.
2) රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධව කටයුතු කිරීම.
3) රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ විදේශ නිවාඩු අනුමත කිරීම සම්බන්ධව කටයුතු කිරීම.
4) රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ විනය සම්බන්ධව කටයුතු කිරීම.
5) දේශපාලන පළිගැනීම්වලට ලක් වූ රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධව කටයුතු කිරීම.

ආයතන හා විනය අංශයේ කටයුතු පිළිබඳව 2024.01.01 වන දින සිට 2024.12.31 වන දින දක්වා ප්‍රගතිය

වගුව 10

අනු අංකය	විස්තරය	ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව	ලබා දුන් තීරණ සංඛ්‍යාව	මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින ගොනු සංඛ්‍යාව
01	**උසස් වීම් /පෙරදාතම් අභියාචනා**			
	i. සහකාර පොලිස් අධිකාරී	76	57	**19**
	ii. පොලිස් අධිකාරී	181	156	**25**
	iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	73	67	**6**
	iv. නියෝජ්‍ය පොලිස්පති	14	12	**2**
	v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති	6	6	**0**
02	**ස්ථාන මාරුවීම්**			
	i. සහකාර පොලිස් අධිකාරී	65	65	-
	ii. පොලිස් අධිකාරී	39	39	-
	iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	73	73	-
	iv. නියෝජ්‍ය පොලිස්පති	27	27	-
	v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති	18	18	-
	vi.වෙනත්ස්ථාන මාරු අභියාචනා	3	3	-
03	**ස්ථිර කිරීම්**			
	i. සහකාර පොලිස් අධිකාරී	76	73	**3**
04	**රාජකාරි ඉටුකිරීම සඳහා පත්කිරීම**			
	i. සහකාර පොලිස් අධිකාරී	-	-	-
	ii. පොලිස් අධිකාරී	5	5	-
	iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	4	4	-
	iv. නියෝජ්‍ය පොලිස්පති	24	24	-
	v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති	2	2	-
05	**ස.පො.අ.සේවයේ පරිවාස කාලය දීර්ඝ කිරීම**			
	i. සහකාර පොලිස් අධිකාරී	66	46	**20**
06	**විශ්‍රාම ගැන්වීම්**			
	i. සහකාර පොලිස් අධිකාරී	13	9	**4**
	ii. පොලිස් අධිකාරී	18	15	**3**
	iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	24	20	**4**
	iv. නියෝජ්‍ය පොලිස්පති	2	2	-
	v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති			-
07	**නිලධාරීන් ද්විතීයික පදනම මත මුදා හැරීම**			
	සහකාර පොලිස් අධිකාරී	1	-	**1**
08	**විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම**			
	පොලිස් අධිකාරී	1	-	**1**
09	**වෙනත් පොදු ඉල්ලීම්**	5	5	-
10	**තොරතුරු පනත යටතේ සිදු කරන ඉල්ලීම්**	63	61	**2**
	එකතුව	**879**	**789**	**90**

මූලාශ්‍රය: ආයතන හා විනය අංශයේ දත්ත ඇසුරෙනි

විනය කටයුතු පිළිබඳ ප්‍රගතිය (2024.01.01 සිට 2024.12.31 දක්වා)

වගුව 11

විනය කටයුතු සඳහා ලැබී ඇති ඉල්ලීම්	2024 වර්ෂය තුළ ලැබී ඇති අභියාචනා/මේ වන විටත් කටයුතු ආරම්භ කර ඇති විනය ගොනුසංඛ්‍යාව	ලබා දුන් තීරණ සංඛ්‍යාව/ අවසන් විනය නියෝග සංඛ්‍යාව	තීරණ ලබා දියයුතු ප්‍රමාණය
i.සහකාර පොලිස් අධිකාරී	31	5	26
ii.පොලිස්අධිකාරී	6	1	5
iii.ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	11	1	10
iv.නියෝජ්‍ය පොලිස්පති	4	-	4
v.ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති	1	-	1
එකතුව	**53**	**7**	**46**

මූලාශ්‍රය: ආයතන හා විනය අංශයේ දත්ත ඇසුරෙනි.

2023 වර්ෂය (2024 දෙසැම්බර් 31 දින දක්වා ආයතන කටයුතු සම්බන්ධ ප්‍රගතිය)

වගුව 12

අනු අංකය	විස්තරය	2023 වර්ෂය තුළ ලැබූ අභියාචනා සංඛ්‍යාව	2023 වර්ෂය තුළ අවසන් කළ ගොනු සංඛ්‍යාව	2023.12.31 දිනට අවසන් කර නොමැති ගොනු සංඛ්‍යාව	2024.12.31 දිනවන විට අවසන් කළ ගොනු සංඛ්‍යාව	මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින ගොනු සංඛ්‍යාව
01	**උසස් වීම් / පෙරදාතම් අභියාචනා**					
	i. සහකාර පොලිස් අධිකාරී	142	62	80	79	1
	ii. පොලිස් අධිකාරී	204	169	35	35	-
	iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	50	32	18	18	-
	iv. නියෝජ්‍ය පොලිස්පති	16	16	0		-
	v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති	12	12	0		-
02	**ස්ථාන මාරුවීම්**					
	i. සහකාර පොලිස් අධිකාරී	64	64	-		-
	ii. පොලිස් අධිකාරී	21	21	-		-
	iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	48	48	-		-
	iv. නියෝජ්‍ය පොලිස්පති	26	26	-		-
	v.ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති	15	15	-		-

03	**ස්ථිර කිරීම්**					
	i. සහකාර පොලිස් අධිකාරී	103	93	10	10	-
04	**රාජකාරි ඉටුකිරීම සඳහා පත් කිරීම**					
	i. සහකාර පොලිස් අධිකාරී	-		-	-	-
	ii. පොලිස් අධිකාරී	1	1	-		-
	iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	27	27	-		-
	iv. නියෝජ්‍ය පොලිස්පති	27	27	-		-
	v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති	10	10	-		-
05	**ස.පො.අ.සේවයේ පරිවාස කාලය දීර්ඝ කිරීම**					
	i. සහකාර පොලිස් අධිකාරී	58	54	4	4	-
06	**විශ්‍රාම ගැන්වීම්**					
	i. සහකාර පොලිස් අධිකාරී	52	52	-		-
	ii. පොලිස් අධිකාරී	19	18	1	-	1
	iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	15	14	1	1	-
	iv. නියෝජ්‍ය පොලිස්පති	-		-	-	-
	v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති	1	1	-		
	එකතුව	**911**	**762**	**149**	**147**	**2**

මූලාශ්‍රය: ආයතන හා විනය අංශයේ දත්ත ඇසුරෙනි.

2023 වර්ෂය (2024.12.31 දිනට විනය කටයුතු සම්බන්ධව ප්‍රගතිය)

වගුව 13

විනය කටයුතු සඳහා ලැබී ඇති ඉල්ලීම්	2023 වර්ෂය තුළ ලැබී ඇති අභියාචනා/මූලික විමර්ශන ගොනු සංඛ්‍යාව	2023 වර්ෂය තුළලබා දුන් තීරණ සංඛ්‍යාව/ අවසන් කරන ලද ලිපි හා ගොනු සංඛ්‍යාව	2023.12.31 දින වන විට කටයුතු අවසන් කර නොමැති විනය ගොනු සහ ලිපි සංඛ්‍යාව	2024 දෙසැම්බර් මාසය දක්වා අවසන් කළ ගොනු සහ ලිපි සංඛ්‍යාව	තීරණ ලබා දිය යුතු ප්‍රමාණය
i. සහකාර පොලිස් අධිකාරී	82	23	59	30	29
ii. පොලිස් අධිකාරී	15	7	8	2	6
iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී	27	9	18	7	11
iv. නියෝජ්‍ය පොලිස්පති	9	6	3	0	3
v.ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති	8	7	1	0	*1
වෙනත් පැමිණිලි	9	1	8	8	-
එකතුව	**150**	**53**	**97**	**47**	**50**

මූලාශ්‍රය: ආයතන හා විනය අංශයේ දත්ත ඇසුරෙනි.

*ජ්‍යෙ.නි.පො. නිලන්ත ජයවර්ධන මහතා සම්බන්ධයෙන් ද විනය කටයුතු සිදු කරනු ලැබුවද එම ගොනුව ආරම්භ කර ඇත්තේ NPC/EST/DISC/ASP/1/2023 අංකයක් සහිත සහකාර පොලිස් අධිකාරී ගොනුවක් ලෙසය. එබැවින් ස.පො.අ. ගොනු 28ක් ලෙසත් ජ්‍යෙ.නි.පො. ගොනු 02ක් ලෙසත් විය යුතුය.

2.5 අභ්‍යන්තර විගණන ඒකකය

ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුල පවතින ශ්‍රී.ලං.ග.සේ. II/III තනතුරක් වන අභ්‍යන්තර විගණක තනතුර සඳහා මෙතෙක් නිලධරයෙකු පත්කර නොමැති අතර ඒ සඳහා සුදුසු නිලධරයෙකු අනුයුක්ත කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් වෙත නොයෙක් අවස්ථාවන් හිදී දැනුම් දී ඇතත් මේ දක්වා නිලධරයෙකු අනුයුක්ත කර නොමැති බැවින් අභ්‍යන්තර විගණක අංශයක් ස්ථාපිතව නැත.

එසේ වුවද 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 41 වන වගන්තිය හා DMA/2/2019 හා 2019.01.12 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛය පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේද සහභාගීත්වයෙන් නියමිත පරිදි පවත්වාගෙන යනු ලැබේ. 2024.12.31 දින වන විට කාර්තු රැස්වීම් තුනක් පවත්වා ඇත.

2.6 නීති ඒකකය

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නීති ඒකකය නීති නිලධාරීන් දෙදෙනෙකු මගින් ක්‍රියාත්මක වේ. එක් නීති නිලධරයෙකු පොලිස් නිලධරයන් විසින් පරිපාලන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචන නඩු සම්බන්ධයෙන් කටයුතු කරන අතර අනෙක් නිලධරයා ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ගොණු කරනු ලබන නඩු සම්බන්ධයෙන් ක්‍රියා කරයි.

පොලිස් නිලධරයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන මූලික අයිතිවාසිකම් පෙත්සම් පිලිබඳව ගරු නීතිපතිවරයා වෙත නිරීක්ෂණ ඉදිරිපත් කිරීම, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන රිට් පෙත්සම් පිලිබඳව නිරීක්ෂණ ඉදිරිපත් කිරීම, ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂය පථයට අදාලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති සියළුම අභියාචනා ගොනු සම්බන්ධයෙන් කටයුතු කිරීම, ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂය පථයට අදාලව ඉදිරිපත් කරන වෙනත් නීති කටයුතු සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා දීම කොමිෂන් සභාවේ අනෙකුත් අංශ ක්‍රියාත්මක වීමේ දී පැන නගින වෙනත් නෛතික අවශ්‍යතා සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම නීති අංශය මගින් ඉටු කරනු ලබයි.

2024.01.01 සිට **2024.12.31** දක්වා නීති අංශයේ ක්‍රියාත්මක වන ගොනු පිළිබඳ සංඛ්‍යාත්මක විස්තර

වගුව 14

වර්ෂය	**2024.12.31** දින දක්වා ක්‍රියාකාරී නඩු	**2024.12.31** වන දින දක්වා අවසන් වූ නඩු/තීන්දුව ලබා දුන් නඩු/ඉවත් කරන ලද නඩු	ක්‍රියාකිරීමට පවතින ගොනු
2008	01	-	01
2009	01	-	01
2010	03	-	03
2011	03	02	01
2012	03	-	03
2013	02	02	-
2014	03	-	03
2015	04	-	04
2016	09	01	08
2017	05	02	03
2018	11	-	11
2019	30	04	26
2020	70	23	47
2021	27	05	22
2022	21	02	19
2023	33	01	32
2024	22	02	20
මුළු එකතුව	**248**	**44**	**204**

මූලාශ්‍රය: නීති ඒකකයේ දත්ත ඇසුරෙනි.

❖ ඒ අනුව 2024.12.31 දිනට නඩු කටයුතු 204ක් තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

2024.01.01 සිට 2024.12.31 දක්වා නීති අංශයේ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට (AAT) අදාළව ලැබුණු ගොනු සංඛ්‍යාව සහ නිරීක්ෂණ ලබාදුන් ගොනු පිළිබඳ විස්තර

වගුව 15

අනු අංකය	වර්ෂය	ලැබුන මුළු ලිපි ගොනු	නියෝග ලද වැඩ අවසන් ගොනු		ක්‍රියා කිරීමට ඇති සම්පූර්ණ ගොනු		
			ක්‍රියා කිරීමට ඇති සම්පූර්ණ ගොනු	පො.කොං.ස. විසින් නිරීක්ෂණ ලබා දී ඇති නමුත් AAT විසින් තීරණ ලබා දී නොමැති ගොනු	නිරීක්ෂණ ලබා දීමට ඇති ගොනු	ක්‍රියා කිරීමට ඇති සම්පූර්ණ ගොනු
01	2012	01	01	-	-	-	-
02	2013	01	01	-	-	-	-
03	2014	02	01	01	01	-	01
04	2015	02	02	-	-	-	-
05	2016	03	01	02	02	-	02
06	2017	20	02	18	16	02	18
07	2018	88	14	74	68	06	74
08	2019	193	81	112	103	09	112
09	2020	215	09	206	184	17	206
10	2021	37	-	29	26	03	29
11	2022	86	07	79	31	48	79
12	2023	58	-	58	18	40	58
13	2024	251	-	251	02	249	251
	මුළු එකතුව	**957**	**119**	**830**	**456**	**374**	**830**

මූලාශ්‍රය: නීති ඒකකයේ දත්ත ඇසුරෙනි.

2.7 ගිණුම්/ මූල්‍ය අංශය

රජයේ මුදල් රෙගුලාසිවලට අනුකූලව ගිණුම් පවත්වාගෙන යාම සහ ඊට සම්බන්ධ අනෙකුත් කාර්යයන් ඉටු කිරීම ගිණුම් අංශය සතු කාර්යභාරයයි. ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට මහා භාණ්ඩාගාරය සමඟ සෘජුවම කටයුතු කිරීම මෙම අංශයට පැවරී ඇත. අයවැය මඟින් වෙන් කර ඇති අරමුදල් මුල්‍ය අවශ්‍යතාවය මත ලබාදීම එහිදී සිදු කරනු ලබයි. අරමුදල් කළමනාකරණය, වියදම් පාලනය, කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයට සහ පළාත් කාර්යාල 10 සඳහා අවශ්‍ය වට්ටෝරු භාණ්ඩ, කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය සැපයීම මෙම අංශයට පැවරී ඇති කාර්යභාරයකි. මීට අමතරව පොලිස් කොමිෂන් සභාවේ සේවය කරන විවිධ සේවාවලට අයත් නිලධාරීන්ගේ වැටුප් ගෙවීම සහ අනෙකුත් වැය දැරීම් පිළිබඳ රාජකාරී ඉටු කිරීම ද මෙම අංශයේ තවත් වගකීමකි.

2.8 ජාතික පොලිස් කොමිෂන් සභාව 2024 වර්ෂයේ ලබා ඇති ජයග්‍රහණ, මුහුණ දුන් අභියෝග සහ ඉදිරි සැලසුම්

2024 වර්ෂයේ දී ලබා ඇති ජයග්‍රහණ :

1. නව කොමිෂන් සභාව 2023 වර්ෂයේ මැයි මස 16 වන දින පත්වීමෙන් අනතුරුව ගතවූ මාස 18 ක් ඇතුලත පහත සඳහන් ගැසට් නිවේදන නිකුත් කර 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන අනුව ජාතික කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික ලෙස කටයුතු කර ඇත.
   i. අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2341/51 දරණ 2023 ජූලි 20 වෙනි දින දරණ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල අභිනියෝජනය කිරීම.
   ii. අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2345/46 දරණ 2023 අගොස්තු මස 16 දිනැති මහජන පැමිණිලි විමර්ශනය සඳහා වන කාර්ය පටිපාටික රීති ඇතුලත් ගැසට් පත්‍රය.
   iii. අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2345/45 දරණ 2023 අගොස්තු මස 16 දිනැති පොලිස් කොමිෂන් සභා අභියාචන කාර්ය පටිපාටික රිති ඇතුලත් ගැසට් නිවේදනය.
2. 1960 ක්ෂණික ඇමතුම් සේවය මඟින් 2023 වර්ෂයේදී ඇමතුම් 11160 ක් සඳහා කටයුතු කර ඇති අතර 2024 වර්ෂයේදී ඇමතුම් 13169 ක් සඳහා කටයුතු කර ඇත.

මුහුණදුන් අභියෝග :

1. නව කොමිෂන් සභාව 2023 වර්ෂයේ එනම් සමාලෝචිත වර්ෂයේ කටයුතු ආරම්භ කරනවිට නව බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය සතුව නොමැතිවීම එම බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැවති විශාල අභියෝගයක් මෙන්ම බාධාවක් විය. ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කරමින් විවිධ උත්සාහයන් දැරුවද අපේක්ෂිත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට නොහැකි වී ඇති අතර තවදුරටත් ඒ පිළිබඳව අවශ්‍ය උත්සාහයන් දරමින් සිටී.
2. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය අතරින් ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/III ශ්‍රේණිවල අනුමත තනතුරු 09ක් ඇතුලු 26ක් පුරප්පාඩුව පැවතීම.
3. විසි එක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවට බලතල පැවරීමෙන් පසුව ශ්‍රී ලංකා පොලිසියේ විධායක සේවා ගණයට අයත් නිලධාරීන්ගේ ක්‍රියාත්මක වෙමින් පැවති ලිපි ගොනු සහ ක්‍රියා කිරීමට ඇති ලිපි විශාල ප්‍රමාණයක් කොමිෂන් සභාව වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ලැබීම හේතුවෙන් ඒ සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක වීම සඳහා ඉහත කාර්ය මණ්ඩල හිගය අභියෝගයක් ලෙස පැවතීම.

4. තොරතුරු දැනගැනීමේ පනත සමග අනුකූල වෙමින් කොමිෂන් සභාවේ පැරණි වාර්තා සංරක්ෂණය විධිමත් කර වාර්තා සංරක්ෂණ ගබඩාව පූර්ණ ලෙස ප්‍රතිසංවිධානය කිරීම.

2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් කරනු ලබන යෝජනා :

1. පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රිති අතිවිශේෂ ගැසට් පත්‍රය පොලිස්පති නිර්දේශ ලද පසුව ප්‍රකාශයට පත් කිරීම.
2. නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අවශ්‍ය සියළු නිර්දේශිත වාර්තා ද සමඟ අදාල අභියාචනය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි කටයුතු විධිමත් කිරීම.
3. පොලිස් කොමිෂන් සභාව මඟින් ගනු ලබන තීරණ නිසි පරිදි ක්‍රියාත්මක වනවාද යන්න සොයා බැලීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.
4. ශ්‍රී ලංකා පොලිසියේ විධායක සේවා ගණයේ නිලධාරීන්ට අදාල වන පත්වීම් බලධරයා ජාතික පොලිස් කොමිෂන් සභාව වන බැවින් එක් එක් නිලධාරියාට අදාල ලිපිගොනුවක් කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යාම.
5. 1960 ක්ෂණික ඇමතුම් සේවාව මඟින් පොලිස් නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් ද ඇමතුම් මඟින් සේවය ලබා දීම සඳහා සේවාව පුළුල් කර ඇති අතර එක් නිලධාරිනියක් මඟින් කටයුතු කරනු ලබන අතර එම කාර්යයන් එකම නිලධාරිනියක විසින් සිදුකිරීම මෙවන විට අපහසු වී ඇති බැවින් 1960 සේවය සඳහා පූර්ණකාලීනව තවත් එක් නිලධාරියෙක් යෙදවීම.
6. ශ්‍රී ලංකා පොලිසිය මහජන හිතකාමී මිත්‍රශීලී පොලිසියක් බවට පත් කිරීමේ අරමුණින් දිවයින පුරා පොලිස් කොට්ඨාස මට්ටමින් පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. 2024 දෙසැම්බර් මාසයේ මෙය ආරම්භ කළ අතර 2025 වර්ෂයේ සියලු පොලිස් කොට්ඨාස දැනුවත් කර අවසන් කිරීම සැලසුම් කර ඇත.


7. ලිපි ද්‍රව්‍ය අවමකරණය සහ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා පොලිස්පති වාර්තා ලබා ගැනීම සහ කැඳවීම ජාලගත ආරක්ෂිත විද්‍යුත් තැපෑල (VPN) මඟින් සිදුකිරීම.

8. මූලික විමර්ශන, විධිමත් විනය පරීක්ෂණ කටයුතු පිළිබඳව නිලධරයන් ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ අනෙකුත් සියළු නිලධාරීන් අදාළ පුහුණුවීම් සඳහා යොමුකරවීම.

03 පරිච්ඡේදය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මුල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



ඒසිජ්-එෆ්


2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ඇස්තමේන්තු 2024 රු.		සටහන	2024 රු.	2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අයිතම		197,465,000	167,703,000	ඒසිජ්-3
-	කැන්පතු		856,471	30,550	ඒසිජ්-4
-	අත්තිකාරම් ගිණුම්		5,664,541	5,047,949	ඒසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		203,986,012	172,781,499	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		203,986,012	172,781,499	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		94,768	246,604	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ආ)		203,891,244	172,534,894	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
98,506,050	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	96,700,675	76,420,559	
96,784,950	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	94,938,545	75,082,350	ඒසිජ්-2(ii)
500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	419,331	445,043	
-	පොළී ගෙවීම්	8	-	285,693	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	3,615,607	
195,791,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		192,058,551	155,849,252	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
1,500,000	වැඩිදියුණු කිරීම්	10	1,214,317	4,270,723	
9,624,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	9,507,770	4,835,783	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිජ්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
500,000	හැකියා වර්ධනය	14	500,000	488,875	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
11,624,000	මුළු මූලධන වියදම් (උ)		11,222,087	9,595,382	
	කැන්පතු ගෙවීම්		864,421	29,150	ඒසිජ්-4
	අත්තිකාරම් ගෙවීම්		5,203,719	7,457,972	ඒසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		6,068,140	7,487,122	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		209,348,778	172,931,755	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		-5,457,535	-396,861	
	අගිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		-5,457,535	-396,861	ඒසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අගිම ශේෂය		-	-	ඒසිජ්-3
			-	-	

1

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.

3.2 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



ඒසිඒ-පි

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්සා 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	85,777,542.28	65,083,044.53
මූල්‍ය වත්කම්			
[illegible]කාරම් ගිණුම	ඒසිඒ-5/5(ඒ)	10,757,859.54	11,218,681.79
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මූල්‍ය වත්කම්		96,535,401.82	76,301,726.32
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		10,757,859.54	11,210,731.79
දේපළ පිරියත හා උපකරණ සංචිතය		85,777,542.28	65,083,044.53
තුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(සී)	-	
ප්‍රමේය වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	0.00	7,950.00
අනුමේය ශේෂය	ඒසිඒ-3	-	-
මූල්‍ය වගකීම්		96,535,401.82	76,301,726.32

පිටු අංක 07 සිට 32 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 33 සිට 57 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත.** ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2025.02.20	දිනය : 2025.02.20	දිනය : 2025/02/19
තමරා ඩී. පෙරේරා	තමරා ඩී. පෙරේරා	ඩී. එල්. ඩී. ප්‍රේමි
ලේකම්	ලේකම්	ප්‍රධාන ගණකාධිකාරි
ජාතික පොලිස් කොමිෂන් සභාව	ජාතික පොලිස් කොමිෂන් සභාව	

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.

3.3 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒඑසී-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

		රුපියල්
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය බදු ලැබීම්	-	-
කප්පාදු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභාංශ	-	-
අනෙකුත් නොවන ලැබීම්	4,383,227	2,962,729
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
සේවා ලැබීම්	197,465,000	167,703,000
සේවාකාරම් අයකර ගැනීම්	6,525,124	8,067,047
තැන්පතු ලැබීම්	856,471	30,550
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**209,229,822**	**178,763,326**
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුදුසුලු පඩිනඩි හා මෙහෙයුම් වියදම්	191,425,496	155,081,476
සේවාධාර සහ මාරුකිරීම්	419,331	445,043
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	-	5,829,725
කාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	94,768	246,604
සේවාකාරම් ගෙවීම්	5,203,719	7,535,946
තැන්පතු ගෙවීම්	864,421	29,150
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**198,007,734**	**169,167,944**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**11,222,087**	**9,595,382**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් විකිණීම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
ප්‍රාග්ධනය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	11,222,087	9,595,382
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**11,222,087**	**9,595,382**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(11,222,087)**	**(9,595,382)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0.00**	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

මූල්‍ය ප්‍රකාශන වල ඇති ඉහත සියලු අගයන් භාණ්ඩාගාර ප්‍රකාශන සමඟ සැසඳේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම්	
		මූල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ක් ලෙස
20.02.02.99 (12202099)	පොලිය-වෙනත්			489	අදාල නොවේ.
20.03.99.00 (12399000)	අනෙකුත් ලැබීම්			638	
20.04.01.00 (12401000)	වැ.අ.වි.වැටුප් දායක මුදල්			2,912	
2002.01.01 (12201001)	රජයේ වත්කම් වලින් ලැබෙන ආදායම් -රජයේ ගොඩනැගිලි			8	
2006.02.01 (12602001)	ප්‍රාග්ධන ආදායම් - වාහන			288	
2006.02.02 (12602002)	ප්‍රාග්ධන ආදායම් -වෙනත්			48	

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	183,000	195,791	192,059	98.09%
ප්‍රාග්ධන	8,000	11,624	11,222	96.54%

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ක් ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	අදාල නැත	අදාල නැත	අදාල නැත	අදාල නැත	අදාල නැත	අදාල නැත

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.


3.8 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 මුල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ක් ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	නැත.	නැත.	නැත.	100
9152	යන්ත්‍රෝපකරණ	85,778	85,778	නැත.	
9153	ඉඩම්	නැත.	නැත.	නැත.	
9154	අස්පෘශ්‍ය වත්කම්	නැත.	නැත.	නැත.	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	නැත.	නැත.	නැත.	
9160	ක්‍රියාත්මක වන වැඩ	නැත.	නැත.	නැත.	
9180	බදු දෙන ලද වත්කම්	නැත.	නැත.	නැත.	

මූලාශ්‍රය: ගිණුම් අංශයේ දත්ත ඇසුරෙනි.

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ජේඑල්ඔ/ඩී/එන්පීසී/2024
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2025 මැයි 26 දින

ලේකම්
ජාතික පොලිස් කොමිෂන් සභාව

ශීර්ෂය 008 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය - 008 ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික පොලිස් කොමිෂන් සභාව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

2. **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **වියදම් කළමනාකරණය**

(අ) 2024 දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 4ක් සඳහා මූලික වියදම් ඇස්තමේන්තුව ඉක්මවා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.16,415,000ක් ලබාගෙන තිබුණු අතර, වැය විෂයය අංක 2102 සඳහා ලබාගෙන තිබුණු පරිපූරක ඇස්තමේන්තුව මූලික ඇස්තමේන්තුව මෙන් සියයට 164ක් වීම හේතුවෙන් මූලික ඇස්තමේන්තු සකස් කිරීම ඵලදායී කළමනාකරණ උපකරණයක් ලෙස භාවිතාකර නොතිබුණි.

(ආ) 2024 වර්ෂයේ වැය විෂයය අංක 1201 සඳහා මු.රෙ. 66 මගින් මාරුකළ වටිනාකම මූලික වියදම් ඇස්තමේන්තුව මෙන් සියයට 56ක් වූ අතර, මූලික වියදම් ඇස්තමේන්තුවක් සිදු නොකරන ලද වැය විෂයය අංක 1102 සඳහා වර්ෂය තුළ මු.රෙ. 66 මගින් රු.225,550ක් මාරුකර තිබුණි.

3.2 **සීමා ඉක්මවීම**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ මු.රෙ. 15(1)(ඇ) ප්‍රකාරව විසර්ජන පනතින් බලය දෙනු ලබන උපරිම හරශේෂ සීමාව රු.10,000,000ක් වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කේවල ණයශේෂයන්ගේ එකතුව රු.10,757,860ක් වූයෙන් එදිනට ද රු.757,860කින් උපරිම හරශේෂ සීමාව ඉක්මවා පැවතුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

4.1.1 **දැක්ම හා මෙහෙවර**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 155(උ) ව්‍යවස්ථාව ප්‍රකාර කොමිෂන් සභාවේ අරමුණු කරා ළඟාවීම සඳහා අවශ්‍ය බලතල ලබාදී තිබුණ ද, පහත සඳහන් කාර්යය භාරයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉටුකිරීමට කටයුතුකර නොතිබුණි.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(උ)(1)(අ) ව්‍යවස්ථාව ප්‍රකාර ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති සම්පාදනයකර ගැසට්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා පොලිසියේ විධායක සේවා ගණයේ තනතුරු හැර අනෙකුත් කාර්ය මණ්ඩලය සහ සහායක සේවා කාර්යමණ්ඩලවලට අදාළ සේවා සඳහා නිලධාරීන් බඳවාගැනීම, උසස් කිරීම සහ ස්ථාන මාරු කිරීම පිළිබඳ පටිපාටි සකස්කර ගැනීමට නොහැකි වී තිබුණි.

4.1.2 **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම**

(අ) මහජන පැමිණිලි විමර්ශනය

විගණනයට ලබාදී තිබුණු තොරතුරු අනුව මහජන පැමිණිලි විමර්ශන අංශයේ ප්‍රගතිය පහත පරිදි වේ.

(i) 2024 වර්ෂයේ දී විමර්ශන අංශයට ලැබී තිබූ මහජන පැමිණිලි 2863න්, පැමිණිලි 335ක් එනම් සියයට 12ක් විමර්ශන අවසන්කර තිබුණු අතර, මහජන පැමිණිලි 2528ක් එනම් සියයට 88ක විමර්ශන කටයුතු අවසන්කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ මහජන පැමිණිලි විමර්ශන අංශයේ බස්නාහිර II අංශය වෙත ලැබී තිබූ මහජන පැමිණිලිවලින් සියයට 34ක විමර්ශන කටයුතු අවසන්කර තිබුණු අතර, අනෙකුත් පළාත් 8හි සහ බස්නාහිර I අංශයේ මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ ප්‍රගතිය සියයට 11කට වඩා අඩු ප්‍රතිශතයක් විය. පළාත් වශයෙන් ද විමර්ශන කාර්යාල ආරම්භකර ඇති තත්ත්වයක් තුළ ද මෙලෙස කාර්යසාධනය ඉතා අඩු ප්‍රතිශතයක් වී තිබුණි.

(iii) 2016 සිට 2023 කාලපරිච්ඡේදයේ විමර්ශනය කිරීමට ලැබී තිබුණු මහජන පැමිණිලිවලින් 2024 ජනවාරි 01 වන දිනට පැමිණිලි 3072ක් විමර්ශන සිදුකිරීමට තිබුණු අතර, එයින් පැමිණිලි 698ක විමර්ශන අවසන්කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට පැමිණිලි 2374ක් එනම් සියයට 77ක විමර්ශන කටයුතු අවසන්කර නොතිබුණු අතර, ප්‍රධාන කාර්යාලයට ලැබී තිබූ පැමිණිලි කිසිවක් විමර්ශනයකර නොතිබුණි. මෙලෙස වාර්ෂිකව ලැබෙන මහජන පැමිණිලිවල විමර්ශන කටයුතු එම වර්ෂයේදීම අවසන් කිරීමට නොහැකි වීම මත මහජනතාව අපේක්ෂිත සහන ලැබී නොතිබුණි.

(iv) ශ්‍රී ලංකා පොලිසියේ කාර්යභාරය ඉටුකිරීම පිළිබඳව මහජනතාවට ගැටළු සහගත වීම හේතුවෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබෙන මහජන පැමිණිලි 2021 සිට 2024 වර්ෂය දක්වා පිළිවෙලින් 1893, 1676, 2448ක් හා 2863ක් ලෙස ක්‍රමිකව වැඩි වී තිබේ. ඒ අනුව ශ්‍රී ලංකා පොලිසිය කාර්යභාරය ඉටුකිරීමේදී මහජනතාව තෘප්තිමත් වී නොමැති බැවින්, සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් පැමිණිලිවල ස්වභාවය අනුව සියයට 29ක් පොලිසිය විසින් ක්‍රියා නොකිරීමත්, සියයට 23ක් බලය අයථා ලෙස පරිහරණය සඳහාත් විය. එබැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊ(3) වගන්තිය ප්‍රකාරව පොලිස් සේවයේ කාර්යක්ෂමතාවය සහ ස්වාධීනතාවය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) නීති ඒකකයේ සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කරන ලද නඩුගොනු 32ක් ද ඇතුලුව ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ පැවති නඩු 248න් නඩුගොනු 44ක් සඳහා පමණක් අවසන් තීන්දු ලබාදී හෝ නඩුගොනු ඉවත්කර හෝ තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය යටතේ පවරන ලද නඩු 251ක් ද ඇතුලුව මුළු නඩු 957කින් සමාලෝචිත වර්ෂය තුළදී නියෝග ලැබී වැඩ අවසන් කරන ලද නඩු සංඛ්‍යාව 119ක් පමණි.

6

(ඇ) 2024 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා පොලිසියේ රාජ්‍ය නිවේදිත නිලධාරින්ගේ විනය සම්බන්ධ කටයුතු කිරීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ ආයතන හා විනය අංශය වෙත විනය ලිපිගොනු 150ක් ලැබී තිබුණු අතර, ඉන් ලිපිගොනු 54කට පමණක් තීරණ ලබාදී අවසන්කර තිබුණි. නියෝජ්‍ය පොලිස්පති හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති යන තනතුරු සඳහා ලැබී තිබුණු විනය ලිපිගොනු 08න් ලිපිගොනු 05කට ආදළව විනය නියෝග 2024 දෙසැම්බර් 31 දින වන විට ලබාදී නොතිබුණි.

(ඈ) 2024 ජනවාරි 01 දිනට පෙර ලැබී තිබුණු අභියාචනා 2275න් අභියාචනා 740ක් හෙවත් සියයට 37ක් සඳහා කොමිෂන් සභා තීරණ ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු 2100ක් වූ අභියාචනාවලින් අභියාචනා 620ක් හෙවත් සියයට 30ක් සඳහා පමණක් කොමිෂන් සභා තීරණ ලබාදී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට ලැබී ඇති අභියාචනා 4375න් සියයට 69ක් හෙවත් අභියාචනා 3015ක් සඳහා කොමිෂන් සභා තීරණ ලබාදී නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා 2024 මැයි මස පරිගණක දෙකක් මිලදීගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණු අතර, එහිදී සුදුසුකම්ලත් සැපයුම්කරු පරිගණක දෙක සඳහා වැට්බදු රහිත මිල රු.430,000ක් ලෙසත් වැට්බදු ප්‍රමාණය රු.77,400ක් ලෙසත් ඒ අනුව මුළු මුදල රු.507,400 ලෙස මිලගණන් ඉදිරිපත්කර තිබුණු අතර, පරිගණක මිලදීගැනීමෙන් පසු සැපයුම්කරු ව්‍යාජ ලෙස සකසන ලද වැට්බදු රහිත ඉන්වොයිසියක් ඉදිරිපත්කර රු.507,400ක මුළු මුදලම ලබාගෙන තිබුණි. ගෙවීම් කිරීමේදී මෙවැනි ඉන්වොයිස් කෙරෙහි කොමිෂන් සභාවේ නිසිඅවධානය යොමුනොවීම හේතුවෙන් අදාළ වැට්බදු ආදායම් ප්‍රමාණය රජයට අහිමි වීමට අවස්ථාවක් විය හැක.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව කොමිෂම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිතකර නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්යයමණ්ඩලය, තථ්‍ය කාර්යයමණ්ඩලය

කොමිෂන් සභාවේ කාර්යයභාරය ඉටුකිරීම සඳහා 2024 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත ප්‍රමාණය	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	31	24	07
තෘතීයික මට්ටම	04	03	01
ද්විතීය මට්ටම	79	62	17
ප්‍රාථමික මට්ටම	19	18	01
එකතුව	133	107	26

ජාතික පොලිස් කොමිෂන් සභාවේ පුරප්පාඩු සේවක සංඛ්‍යාව 26ක් වූ අතර, ඉන් 07ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ ද, තෘතීයික මට්ටමේ එක් තනතුරක් ද, ද්විතීක මට්ටමේ තනතුරු 17ක් හා ප්‍රාථමික මට්ටමේ එක් තනතුරක් ද ලෙස පුරප්පාඩුව පැවතුණි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07ක් හෙවත් සියයට 23ක පුරප්පාඩු පැවතීම කොමිෂන් සභාවේ අරමුණු ඉටුකර ගැනීමේදී බාධාවක් වී තිබුණි.

යූ.එන්. අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට (වැ.බ)

04 පරිච්ඡේදය
කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරකම් සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
පොලිසියට එරෙහිව පොලිස් නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි හා අපරාධ ස්වභාවයක් ගන්නා පැමිණිලි විමර්ශනය කිරීම සඳහා විශේෂ විමර්ශන ඒකකයක් ස්ථාපනය කිරීම.		✓	
රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු වීම් සහ විනය කටයුතු සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා/ඉල්ලීම් සඳහා සාධාරණ කාලයක් ඇතුළත සහන සැලසීම.	✓		
රාජ්‍ය නිවේදිත නොවන නිලධාරීන්ගේ සහ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු වීම් සහ විනය කටයුතු සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා/ඉල්ලීම් සඳහා සහන සැලසීමේ ප්‍රගතිය		✓	
ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරයේ සහ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ පවතින නඩු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් වන ප්‍රගතිය		✓	
ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබෙන සියලු මහජන පැමිණිලි විමර්ශනය කිරීම සහ සහන සැලසීම.		✓	
1960 දුරකථන අංකයට ලැබෙන ඇමතුම්/ඉල්ලීම් සඳහා සහන සැලසීමේ ප්‍රගතිය	✓		
කාර්ය මණ්ඩලය දැනුමින්, කුසලතාවලින් සහ ආකල්ප වලින් සන්නද්ධ කරනු වස් ඔවුන් සඳහා පුහුණු සැලැස්මක් පිළියෙල කිරීම.	✓		
කොමිෂන් සභාවේ තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන			✓
මහජනයාට හා පොලිස් නිලධාරීන්ට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකිවන පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම.			✓
තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මහජනයා හා පොලිස් නිලධාරීන් විසින් කර ඇති සියලු තොරතුරු ඉල්ලීම සඳහා අවසන් ප්‍රතිචාර දැක්වීම.	✓		

පාර්ලිමේන්තුවට සහ ජනාධිපති කාර්යාලය වෙත යොමුකළ යුතු පරිපාලන වාර්තා කලට වේලාවට යැවීම.	✓		
ජාතික පුවත්පත් වෙත ප්‍රවෘත්ති/නිවේදනයක් නිකුත් කිරීම, සහ සාවද්‍ය ප්‍රවෘත්ති නිවැරදි කිරීම් කටයුතු කිරීම.	✓		

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
SDG ඉලක්ක 16 ජාතික ව්‍යවස්ථාපිත නීතිවලට අනුකූලව (තොරතුරු දැනගැනීමේ පනත) තොරතුරු දැනගැනීමේ හැකියාව ශක්තිමත් කිරීම.	මහජනයා හා පොලිස් නිලධාරීන් විසින් ඉල්ලා සිටින තොරතුරු ඉල්ලීම් සියල්ලටම ප්‍රතිචාර දැක්වීම.	2024 වර්ෂය තුළ ඉදිරිපත් වූ තොරතුරු ඉල්ලීම් 122 කින් ඉල්ලීම් 46 කට අදාලව තොරතුරු ලබා දී ඇති අතර ඉල්ලීම් 07 ක් ප්‍රතික්ෂේප කර ඇත.			✓
සෑම මට්ටමකදීම වගකීමට බැඳී සිටින සහ විනිවිදභාවයකින් යුත් ඵලදායී ආයතන සංවර්ධනය කිරීම.	ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා මහජන උපායමාර්ග සංවර්ධනය කිරීම.			✓	
සියලු මට්ටමකට ධාරිතා සංවර්ධනය සඳහා අන්තර්ජාතික සහයෝගීතාවය තුළින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ සමස්ත ධාරිතාව සංවර්ධනය කිරීම.	දේශීය හා විදේශීය කාර්යාල පුහුණුව හරහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ දැනුම කුසලතා හා ආකල්ප ඉහළ නැංවීම.	වේගවත් සේවා සම්පාදනයට මහජන අභියාචනාවන්ට ක්ෂණික ප්‍රතිචාරය වේගවත් සහනය ලබාදීම.		✓	

මූලාශ්‍රය: **පාලන අංශයේ දත්ත ඇසුරෙනි.**

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ජාතික පොලිස් කොමිෂන් සභාවට අදාල තිරසර සංවර්ධන ඉලක්ක වන්නේ SDG ඉලක්ක 5,16 17 වේ. එනම් 5 - ස්ත්‍රීපුරුෂ සමාජභාවී සමානාත්මතාවය, 16 - සාමය යුක්තිය සහ ශක්තිමත් ආයතන, සහ 17 - ඉලක්ක සපුරාගැනීම සඳහා හවුල්කාරීත්වය වේ. මෙම ඉලක්ක සපුරා ගැනීමේදී ජාතික පොලිස් කොමිෂන් සභාවට අභියෝග ගණනාවකට මුහුණපෑමට සිදුවිය. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය නිරන්තරයෙන් වෙනස්වීම හේතුකොට ගෙන මෙම ඉලක්ක සපුරාගැනීමේ උපායමාර්ග සැලසුම්වලට බාධා ඇතිවිය. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ තාක්ෂණික සහ මූල්‍ය අනුග්‍රහය යටතේ 2016 සිට ක්‍රියාත්මක කළ වැඩසටහන් 20 වන සංශෝධනයත් සමඟ අඩාල වූ අතර නැවත 21 වන සංශෝධනයෙන් බලතල ලැබීමත් සමග ඉහත වැඩසටහන් තුළින් තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා මේ වනවිට කටයුතු සැලසුම් කරමින් පවතී

06 පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	31	24	07
තෘතීයික	04	03	01
ද්විතීයික	78	62	16
ප්‍රාථමික	20	18	02

මූලාශ්‍රය: පාලන අංශයේ දත්ත ඇසුරෙනි.

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සඳහා අදාල පත්වීම් බලධාරින් විසින් නිලධාරින් ලබා නොදීම නිසා දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇති අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද ලිපි ගොනු සහ දෛනික අභියාචනා කඩිනමින් අවසන් කිරීමට මානව සම්පත් හිඟය බලපෑම් කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

කාර්යාලීය අවශ්‍යතා පදනම් කරගනිමින් සියළුම කාර්ය මණ්ඩලය ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ඇතැම් ක්ෂේත්‍ර සඳහා විශේෂයෙන්ම නව තාක්ෂණික දැනුම පිළිබඳ පුහුණුව කාර්ය මණ්ඩලය වෙත ලබාදීමට නිරන්තරව කටයුතු කර ඇත. එමගින් කොමිෂන් සභාවේ කටයුතුවල කාර්යසාධනය ඵලදායී මෙන්ම පෙරට වඩා වේගවත් වී ඇත. ආයතනින අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කරගැනීම මුලික කරගත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් කාර්ය සාධනය ඉහළ නැංවීම කටයුතු කර ඇත.

07 පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දින ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අදාල නැත.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ	අදාල නැත.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාල නැත.	
1.6	වෙනත්	අනුකූල නොවේ	අදාල නැත.	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නැත.	මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත.

2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යා වක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත.	මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත.
4.4	වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත.	මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත.	මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත.

6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත.	මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත.
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත.	මෙම තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් අභ්‍යන්තර විගණන නිලධරයෙකු පත්කිරීම සිදුකර නැත.
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණ**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			

11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලැඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 37 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	ආදායම් මුදල් රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		

15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ.		ආයතනයේ ඇතැම් අංශ විසින් සිය පුරවැසි/ සේවාලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කර අවසන් කිරීමෙන් පසුව ආයතනයේ සමස්ත පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තිය ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කිරීමට

				ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		ආයතනයේ සමස්ත පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තිය ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කරනවිට ඇගයීම් ක්‍රමවේදය සකස් කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.
19	**මානව සම්පත් සැලැස්ම සම්පදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානය

ඇමුණුම 01

ජාතික පොලිස් කොමිෂන් සභාවේ
පළාත් කාර්යාල

බස්නාහිර පළාත පළාත් අධ්‍යක්ෂ (බස්නාහිර පළාත) ගොඩනැගිලි අංක 09, **BMICH**, කොළඹ 07. ☎ **:** 0112166504, 0112166521**/2** ෆැක්ස් : 0112166577 ඊමේල්: **info@npc.gov.lk** වෙබ් අඩවිය : **www.npc.gov.lk** **: 0710361010**	**උතුරු පළාත** පළාත් අධ්‍යක්ෂ (උතුරු පළාත) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. ☎ 0112166535
සබරගමුව පළාත පළාත් අධ්‍යක්ෂ (සබරගමුව පළාත) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නව නගරය, රත්නපුර. ☎ **:** 0112166538	**උතුරු මැද පළාත** පළාත් අධ්‍යක්ෂ (උතුරු මැද පළාත) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. ☎ **:** 0112166531
ඌව පළාත පළාත් අධ්‍යක්ෂ (ඌව පළාත) අංක 05, පිලිපොතගම පාර, බදුල්ල. ☎ : 0112166532	**දකුණු පළාත** පළාත් අධ්‍යක්ෂ (දකුණු පළාත) පළමු මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. ☎ : 0112166534
වයඹ පළාත පළාත් අධ්‍යක්ෂ (වයඹ පළාත) 3 වන මහල, අංක. 08 කාමරය, පේෂකර්ම වෙළඳ සංකීර්ණය, අංක 04, මිහිඳු මාවත, කුරුණෑගල. ☎ : 0112166536	**මධ්‍යම පළාත** පළාත් අධ්‍යක්ෂ (මධ්‍යම පළාත) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. ☎ : 0112166537
නැගෙනහිර පළාත පළාත් අධ්‍යක්ෂ (නැගෙනහිර පළාත) ග්‍රීන් වීදිය, මඩකලපුව. ☎ : 0112166533	